# 19 කවිය සහ කවියා

'කවිය' සිත් සතන් සනසන කලා මාධ්‍යයකි. එය තොටිල්ලේ නැළැවෙන බිළිඳාට මෙන් ම නිසංසලේ කල් ගෙවන මහල්ලාට ද සැනසුම ලබා දෙයි. බිළිඳා නළවන මව කවි ගායනය කරයි. නිසංසලේ පසුවන මහල්ලාගේ මුවින් ද නිහඬව හෝ ගැයෙන්නේ කවියකි. කවියට ඇලුම් නො කරන කෙනෙක් නැත. අපි රසවත් ලෙස කවි ගායනා කරමු; කවි හදමු; රස විඳිමු.

කවියා ලෝකය දෙස බලන්නේ අපූර්ව ආකාරයකිනි. වෙනත් කෙනෙකු බලන ආකාරයෙන් නො වේ. ඔහු ලෝකයේ පවත්නා සුන්දරත්වය කෙරෙහි අවධානය යොමු කරයි. ගලන ඇළ දොළෙහි, උඩට නැගෙන මුහුදු රැල්ලෙහි, වෘක්ෂලතාවල, සතුන්ගේ විවිධ හැසිරීම්වල අපූර්ව සුන්දරත්වයක් ඔහු දකියි. ආදරය, ශෝකය වැනි හැඟීම් ගැන ඔහුගේ අවධානය යොමු වේ. සමාජයේ දුක්බර පැත්ත මෙන් ම සැපවත් අංශය ගැන ද එබී බැලීමට ඔහු ඉදිරිපත් වෙයි. මේ අනුව කවියාගේ කල්පනා ලෝකය පොදු ජනතාවගේ සිතුවිලිවලට වඩා වෙනස් වේ.

කවියකු කවියක් රචනා කිරීමෙන් අපේක්ෂා කරන්නේ තමා ලැබූ අත්දැකීමක් අපූර්ව ආකාරයෙන් ඉදිරිපත් කර සහෘදයාගේ සිතෙහි රසවින්දනයක් ඇති කිරීම ය. එබැවින් කවියාගේ මූලික අරමුණ වන්නේ රස නිෂ්පත්තිය ය. රස මවන කවි ලිවීම එතරම් පහසු නො වූවත්, එය කළ නො හැකි දෙයක් ද නො වේ. කවි ලිවීමේ හැකියාව සෑම දෙනා තුළ ම එක හා සමාන ව පිහිටා නැතත් ඒ සඳහා යම් කුසලතාවක් හැම දෙනා සතු ව පවතී. එම කුසලතාව මුවහත් කර ගැනීම සඳහා නිතර නිතර හොඳ කවි තෝරා ගෙන කියවීමත්, රසවිඳීමත්, කවි ලිවීමෙහි නිරත වීමත් අවශ්‍ය ය.

කවියේ ප්‍රභේද තුනක් දක්නට ලැබේ. එනම් ගද්‍ය, පද්‍ය හා මිශ්‍ර යනුවෙනි. උචිත පරිදි නිර්මාණය කරන ලද රසවත් වැකි ගැළපීමෙන් ගද්‍ය ඡේද නිර්මාණය වේ. මෙසේ ක්‍රමවත් ව නිර්මාණය කරන ලද ගද්‍ය ඡේද මැනවින් පෙළ ගැස්වීමෙන් ගද්‍ය කාව්‍ය නිර්මාණය කෙරේ.

පහත සඳහන් ගද්‍ය පාඨය කියවා බලන්න.

**"ගම්මානයත් මුහුදු වෙරළත් වෙන්කෙරෙන පහත් බිම් තීරුවක පිහිටි ලෙවෙස්කාගේ නිවාසය පැල්පතක් වුව ද බැලූ බැල්මට සුන්දර ය. අල්ලක් තරම් වූ ගෙවත්ත එරඬු**

**වැටකින් වට කර ඇත. මිදුලේ සුදු වැටකෙයියා පඳුරක් ද හවසට මල් පිපෙන හෙන්දිරික්කා පඳුරක් ද වැවීමෙන් එහි සුන්දරත්වය තහවුරු කර තිබිණි. සයුර දෙසින් ඇදෙන සීතල සුළං රොදින් පියාසර කරන්නට තතනන වැටකෙයියා පඳුර අද්දර බිලිං ගසකි. ගොනු ගෙල බැඳි ගිගිරි වැලක් මෙන් එය පල දරා ඇත."**

**('සමු ගැනීමක් නොවේ' පරිවර්තනයකි)**

මෙහි කාව්‍යමය ගුණයෙන් පරිපූර්ණ භාෂාවක් යොදා ගෙන ඇති ආකාරය පැහැදිලි ය. ගද්‍ය නිර්මාණ බිහිවන්නේ වාක්‍ය මගිනි.

තාලයකට අනුව වචන යෙදීමෙන් පද්‍ය නිර්මාණය වේ. පද්‍යයක් යනු ඡන්දසකට අනුව විරිත් භාවිත කරන නිර්මාණයකි. ඡන්දස් යනු පද්‍යයේ යෙදෙන අක්ෂර නියමයයි. විරිත් යනු ගුරු හෙවත් දීර්ඝ අකුරු හා ලුහු හෙවත් කෙටි අකුරු විධිමත් පරිදි යෙදීමයි.

ගද්‍ය පද්‍ය අංග දෙක ම යොදා ගනිමින් මිශ්‍ර හෙවත් චම්පූ කාව්‍ය නිර්මාණය කෙරේ. ගද්‍ය, පද්‍ය හා චම්පු කාව්‍ය නිර්මාණයේ දී යොදා ගන්නා බස ගැන ද සැලකිලිමත් විය යුතු ය. එය වාර්තාවක් ලිවීමේ දී යොදා ගන්නා බසට වඩා වෙනස් ය. ඒ සඳහා උපයෝගි කර ගන්නේ රසවත් බස් වහරකි; එනම් කාව්‍යමය භාෂාවකි.

කාව්‍ය වර්ග අතරින් පද්‍ය කාව්‍යය විශේෂත්වයක් ගනී. එයට හේතුව වනුයේ ඡන්දස් හා විරිත් උපයෝගී කොට ගෙන කාව්‍ය නිර්මාණය කිරීමයි. මේ අනුව පද්‍යයේ තාලානුකූලත්වය මතු වේ. ගායනය සඳහා ද පද්‍යය යොදා ගත හැකි ය.

**දත් කැකුළු පා ලා**
**සුරතල් සිනා සී ලා**
**බොළඳ බස් දී ලා**
**කෙළී සියොලඟ දූලි ගා ලා**

**(කාව්‍යශේඛරය)**

කුඩා දරුවකුගේ කෙළිලොල් ජීවිතය සිතුවම් කරන කවියා. ඔහුගේ සිනාව, ඒ අතුරින් මතු වන කුඩා දත් පෙළ, බොළඳ වචන, දරුවා කෙළි සෙල්ලමට යොමු වන ආකාරය ආදි වශයෙන් කුඩා ළමයින්ගේ හැසිරීම් රටාව මවා පෙන්වයි.

පහත දැක්වෙන කවිය ශ්‍රී ලංකාවේ සුන්දරත්වය පවසන්නකි. මහා වැව්, දියවැල් සශ්‍රීක කුඹුරු ආදිය ගැන කවියාගේ අවධානය යොමු වේ.

**තෝපා තඹලගම මිණිපේ මින්නේරි**
**මහ වැව්වලින් දියවැල් ඇදෙමින් බේරී**
**සරු කරවයි කුඹුරු නිල්පැහැයෙන් මේරී**
**මගෙ ලක් මෑණියන්දෑ හරි පින් කාරී**

(පී.බී. අල්විස් පෙරේරා)

පද්‍ය කාව්‍යයේ ප්‍රධාන ආකෘති කීපයක් දක්නට ලැබේ. එනම් ගී, සිව්පද හා සිලෝ යනුවෙනි. ගීයේ ප්‍රධාන පාද දෙකක් වේ. මේ පාද දෙක යළිත් කොටස් හතරකට බෙදා දක්වේ. ගීයෙහි සමාන අකුරු යොදා පාද අවසන් කිරීම සාමාන්‍යයෙන් දක්නට නො ලැබේ. පහත දැක්වෙන ගීය කියවා බලමු.

**රූ සිරි යොවුන් ගුණ - නැණ සියල්ලෙන් නො අඩු වූ මුත්**
**නො දතොත් සිල්ප සත - සුවඳ නැති කෑල මල් සම වේ**

(ලෝකෝපකාරය)

සිවුපදයෙහි පාද හතරක් වේ. එක් එක් පාදය අවසන් වන්නේ එක සමාන අකුරු යෙදීමෙනි. මුලින් ඉදිරිපත් කළ පද්‍ය දෙකෙහි ම මේ ලක්ෂණය දක්නට ලැබේ. පහත දැක්වෙන්නේ දිග විරිතක් අනුව ලියැවුණ තවත් සිව්පදයකි.

**කොටන විදුලිය රිදී රේඛා - සිනා කැන් මල් මෙණෙවියන්නේ**
**නැටෙන නා දලු - ඉරෙන රඹපත් කෙරේ කොහොම ද කව් ලියන්නේ**
**වැටෙන අඹ මල් ඉබේ වියළෙයි කොවුලු මුළු නැත ගී කියන්නේ**
**ගැටෙන මල්වල බඹර මී මැසි පිරිස ගැන කවුරු ද සොයන්නේ**

(පී.බී. අල්විස් පෙරේරා)

මෙහි ඇත්තේ දීර්ඝ පාදයි. එක් එක් පාදය අවසන් වන්නේ සමාන අකුරුවලිනි. මෙසේ සමාන අකුරු එක් එක් පාදයේ අවසානයේ යෙදීම හැඳින්වෙන්නේ '**එළිසමය**' යනුවෙනි.

සිලෝවෙහි ද පාද හතරක් දක්නට ලැබේ. ඇතැම් විට එළිසමය ද පැවතිය හැකි ය. එහෙත් සිලෝව මුලින් දැක්වූ ආකෘති දෙකට ම වඩා වෙනස් වේ. මුලින් දැක්වූ ගී හා සිව්පදවල විශේෂත්වය වූයේ එක් එක් පාදය කිසියම් නියමිත අකුරු ප්‍රමාණයක් යටතේ රචනා කිරීමයි. සිලෝවෙහි ද ඒ ඒ පාදවල සමාන ආකාරයෙන් නියමිත අකුරු ප්‍රමාණයක් පවතී. එහෙත් පාද හතරෙහි ගුරු හෙවත් දීර්ඝ අකුරු මෙන් ම ලුහු හෙවත් හ්‍රස්ව අකුරු ද සමාන ආකාරයකින් යොද තිබීම විශේෂ ලක්ෂණයකි. පහත දැක්වෙන සිලෝව කියවා බලන්න.

**ඇසෙන්නෙ කා කා හඬ සෑම පැත්තෙන්**
**නැගෙව් කියන්නා වැනි දැන් ම නින්දෙන්**
**දොරින් අඩක් මේ ඇරියා ම එන්නේ**
**සිසිල් සුළං ආයුබෝවන් කියා මෙන්**

(කුමාරතුංග මුනිදස)

කාව්‍ය නිර්මාණයට අදාළ අනෙක් අංගය මිශ්‍ර හෙවත් චම්පූ නම් වේ. මෙය ගද්‍ය හා පද්‍ය මිශ්‍ර ව රචිත ය. ශෛලිගත නාට්‍යවල මෙම ස්වරූපය දක්නට ලැබේ. මනමේ නාට්‍යයෙන් උපුටා ගත් මේ කොටස කියවා බලන්න.

**කුමරා වචනය :** "මා කීව අසා තැති නො ගෙන නිසල ව හිඳිනු මැන සොඳුරිය. මොවුහු මේ වනයේ වැද්දෝ වෙති. ඔවුන්ට අනතුරක් නො කළ හොත් ඔවුන් අපට හිංසා නො කරති'යි සිතමි. පලා යන්ට තැත් කළහොත් නිසැකව ම ඔවුහු අපට විදිති"

**කුමරා කුමරිය - තර්ගය**

**කුමරු :** ගියා වැද්දෝ - නොම විද්දෝ - ඉඩ ලද්දෝ - අපි මෙවරා
වෙන්ට අනතුරු කිසි - ගන්ට සිත බිය නිසි
කාරණාව නොම දිසි - මෙවෙලේ

**කුමරි :** තව ඇද්දෝ - පසු එද්දෝ - බිය නැද්දෝ - මෙම ගමනා
යන්ට සටනට සැර - සෙන්ට වේය විගසට
උන්ට මෙහි නේන ලෙස නැවතා

ශබ්ද හා අර්ථ රස දෙක යෝග්‍ය ආකාරයෙන් යෙදීම කවියක උසස් බව ඇති කිරීමට හේතු වේ. ශබ්දය මනාව යෙදීමෙන් ශබ්දාලංකාර ද අර්ථය මනාව යෙදීමෙන් අර්ථාලංකාර ද මතු වේ. ශබ්දය භාවිතයේ දී සමාන අකුරු ළං ළං ව යෙදීම දක්නට ලැබේ. පහත දැක්වෙන කවියෙහි 'නා' ශබ්දය ළං ළං ව භාවිත කිරීමෙන් ශබ්ද රසය තීව්‍ර වන ආකාරය විමසා බලන්න.

**සෙදනා ලොවිනා ළඳුනා ලෙසිනා**
**රැලිනා ලෙළෙනා සොබනා ගතිනා**
**නදනා ගඟනා කෙළිනා ලියනා**
**දකිනා මතිනා හදනා තොසිනා**

(ගිරා සන්දේශය)

කාව්‍ය රචනයේ දී උපමා රූපක ආදි කාව්‍යාලංකාර වැදගත් වේ. උපමා නම් යම් වස්තුවක් වඩාත් හොඳින් පැහැදිලි කිරීම සඳහා තවත් වස්තුවකට සමාන කොට දැක්වීම ය. **බොහෝ විට වැනි, එව්, සේ, ලෙස, අයුරු ආදි පද යොද උපමාව සමග සම්බන්ධ වන වස්තුව හෝ පුද්ගලයා සසඳා දැක්වීම උපමාවල ස්වභාවය යි.** පහත දැක්වෙන කවියෙහි යොද ඇති උපමා මගින් කාන්තාවකගේ දෙබැම, පටු නළල සහ දෙකන් වර්ණනා කොට ඇති ආකාරය විමසා බලන්න.

**දෙබැම දෙව්දුනු වන්**
**පටු නළල අඩසඳ වන්**
**ඇගෙ දිගු යුග ස වන්**
**කෙළන රූ සිරු රනෝවිලි වන්**

**(කාව්‍යශේඛරය)**

මෙහි දී කවියා කාන්තාවන්ගේ දෙබැම දේදුන්නකටත්, පටු නළල අඩ සඳකටත් දිගු කන් රන් ඔන්චිල්ලාවකටත් උපමා කොට දක්වයි.

රූපකය ද කාව්‍යාලංකාර ප්‍රභේදයකි. උපමාවෙහි මෙන් රූපකයේ දී වැනි, සේ, මෙන්, එව්, බඳු ආදි සංසන්දනාත්මක පද දක්නට නො ලැබේ. එම සංසන්දනාත්මක පදයන්ගෙන් තොර ව යෙදුණු උපමා උපමේයයන්ගේ සම්බන්ධය රූපකය නම් වේ. පහත දැක්වෙන කවිය කියවා බලන්න.

**තොල'තුල් පතුල් ප ලු**
**හස මල් කැනින් සිත් කලු**
**පියවුරු පල ඉසු ලු**
**ලියෝ ලිය වැනි පුර සරණ සුලු**

**(කාව්‍යශේඛරය)**

මෙහි කාන්තාවන්ගේ තොල්, අතුල් හා පතුල් ළදලුවලට ද සිනහව මල්වලට ද පියොවුරු පලවලට ද සමාන කොට දක්වා තිබේ. එහි සමස්ත අර්ථය කාන්තාව වැලකට සමාන කිරීම යි.

සිංහල පද්‍ය කාව්‍යයෙහි දක්නට ලැබෙන තවත් විශේෂ අංගයක් වනුයේ ජන කවියයි. මෙහි දී ව්‍යාකරණ ඡන්දස් ආදිය ගැන එතරම් දැඩි ව ඇදී යාමක් දක්නට නො ලැබේ. පොදු ජන බස වහල් කරගැනීම මෙහි පෙනෙන විශේෂත්වය යි. පහත දැක්වෙන කවිය කියවා බලන්න.

**තෙමා වැටේ මගෙ සළුපිළි නෙත් පුරවා**
**අමා රසක් වැනි හිමි සඳ සිහි වෙනවා**
**දමා කුමරු වැඩියා මට සිහි වෙනවා**
**මෙමා හැර ලියෝ ලෙව්තුළ ඇද් ද තවා**

(යශෝදරාවත)

මෑත භාගයේ සිංහල සාහිත්‍යයේ ප්‍රචලිත වූ අංගයක් වනුයේ නිසඳැස් කවියයි. ඡන්දසින් තොර බැවින් නිසඳැස් කවියේ විරිත් භාවිතයක් දක්නට නො ලැබේ. යෝග්‍ය පරිදි පද වෙන් කොට අර්ථවත් ව ඉදිරිපත් කිරීම මේ රචනා වර්ගයේ විශේෂත්වය යි. පහත දැක්වෙන නිසඳැස් කවිය කියවා බලන්න.

**හිස නමා ගති ඈ**
**සිහින් රතැඟිලි පටලවා ගති**
**සතියකට පෙර ගෙනා වර**
**විළිබර ය මගෙ රන්වන් මනාලිය**

(ජී.බී. සේනානායක)

කාව්‍ය නිර්මාණය සඳහා කවියෙකු සතු විය යුතු අවශ්‍යතා කිහිපයක් ගැන ද මෙහි සඳහන් කළ යුතුයි. එයින් එකක් නම් ප්‍රතිභාවයි. **ප්‍රතිභාව** යනු අපූර්ව වස්තු නිර්මාණයෙහි පවත්නා දක්ෂතාවයි. එනම් තමා තෝරා ගත් වස්තු, පුද්ගලයන් හෝ පරිසර ආදිය අපූර්ව ආකාරයෙන් ඉදිරිපත් කිරීමේ සහජ හැකියාවයි. දෙවන අවශ්‍යතාව ලෙස සැලකෙන්නේ **බහුශ්‍රැතභාවය** හෙවත් බොහෝ ඇසූ පිරූ තැන් ඇති බවයි. ප්‍රතිභාවෙන් ඌන වුවත් බහුශ්‍රැතභාවය හා අත්දැකීම්වලින් යුක්ත වේ නම් කාව්‍ය නිර්මාණය කළ හැකි බව මේ අනුව හෙළි වේ. තෙවන අවශ්‍යතාව වනුයේ කාව්‍යකරණයෙහි නිතර නිතර යෙදීමයි. මෙය '**සතතාභ්‍යාසය**' යනුවෙන් හැඳින්වේ. මෙසේ නිතර කවි ලිවීම මගින් නිර්මාණකරණයට යොමු විය හැකි වේ. මේ කරුණු ගැන සලකා බලා නිතර කාව්‍යකරණයට උත්සාහ ගන්නේ නම් දක්ෂ කවියකු වීමේ භාග්‍යය ඔබට ද උදා වනු ඇත.

කවි ලිවීම සඳහා සුදුසු අත්දැකීම් ද තිබිය යුතුයි. ඒ සඳහා තමා අවට පරිසරයෙන් අත්දැකීම් ලබා ගත හැකි වේ. ඔබ සිත් ගත් ජීව අජීව දේ, සොබාදහමේ සුන්දර වස්තු, ඔබ මුහුණ දුන් විවිධ අවස්ථා හෝ සිද්ධි ආදිය ඇසුරෙන් අත්දැකීම් ලබා ගත හැකි ය. විවිධ තේමා ඔස්සේ ලියා ඇති පහත දැක්වෙන කවි කියවා බලන්න.

ඉත්තෑවා
කඳ හාරා
පොල් පැළයේ
බඩ කන්නේ

වල් ඌරා
බිම හාරා
මඤ්ඤොක්කා
අල කන්නේ

(ආනන්ද රාජකරුණා)

සමන් පිච්ච
මල් ඉහිරුණු
නිල් තණකොළ
පිට්ටනියක්
වගෙයි අහස
අන්න බලනු
කොච්චර
ලස්සන ද රැට

(ඇස්. මහින්ද හිමි)

දවස ගැන ලියා ඇති මේ කවි ද කියවා බලන්න.

හිරු නැග එන විට උදයයි
එය බැස යන විට සවසයි
නැග බසින්ට දෙළොස් පැයයි
බැස නගින්ට දෙළොස් පැයයි
දෙකට ම පෑ විසි හතරයි
මුළු ගණන ම එක දවසයි

(ආනන්ද රාජකරුණා)

නූතන කවියෙකු කෝච්චියේ ගමන දකින්නේ මෙසේ ය.

කැලේ මැදින් හඬ තළමින්
මින්නේරිය ජනපදයෙන්
ඈත ඈත කුඹුරු මැදින්
කෝච්චියක් එනවා

අතීතයෙන් මේ යුගයට
රජකාලෙන් ජන යුගයට
ගම්මානෙන් සිදාදියට
කෝච්චියක් එනවා

(ඩබ්.ඒ. අබේසිංහ)

අරුත් පැහැදිලි කිරීම

| | | |
|---|---|---|
| අමා | - | අමෘතය, දෙවියන්ගේ ආහාරය ලෙස සැලකේ |
| ආකෘතිය | - | යමක ඇසට පෙනෙන හැඩරුව /සැලැස්ම |
| උත්තීර්ණය | - | එතෙර වීම |
| උද්දීපනය | - | තියුණු කිරීම |
| කමල | - | නෙළුම් මල |
| නිසග | - | ස්වභාවයෙන් /ඉබේටම |
| රස නිෂ්පත්තිය | - | රස නිපදවීම රස මැවීම, රස ඇති කිරීම |
| සතතාභ්‍යාසය | - | නිතර නිතර පුරුදු වීම |
| ප්‍රතිභාව | - | අපූර්ව වස්තු නිර්මාණය කිරීමේ හැකියාව. |

## ක්‍රියාකාරකම 01

(i). මෙහි දක්වා ඇති කාව්‍ය ආකෘති හඳුන්වා උදාහරණ සපයන්න.

(ii). විවිධ පද්‍ය ආකෘති ඇතුළත් සිංහල කාව්‍ය ග්‍රන්ථ ගැන හැඳින්වීමක් කරන්න.

(iii). ප්‍රතිභාව හා බහුශ්‍රැතභාවය අතර පවත්නා වෙනස්කම් පැහැදිලි කරන්න.

## ක්‍රියාකාරකම 02

**හිස් තැනට උචිත පද්‍ය පේළි ලියා කවි සම්පූර්ණ කරන්න.**

1. ..............................................................................................
අඳුර කෙමෙන් නැති වන්නේ
සිසිල් සුළඟ දැවටෙන් නේ
සිතේ සතුට නළියන්නේ

2. පුලුන් වලාකුළු පාවීලා
නිල් අහසේ තරු පායාලා
..............................................................................................
සඳ කැලුමින් අප නැවීලා

3. රෝස ගසේ මල් පිපිලා
සමනලයෝ වට වීලා
මල් පැණියෙන් මත් වීලා
..............................................................................................

## ක්‍රියාකාරකම 03

I. පහත සඳහන් කොටුව තුළ තිබෙන කවි සංකල්පනාවලින් එකක් තෝරා ගෙන ගද්‍ය/පද්‍ය/නිසඳැස් කවි නිර්මාණයක් කරන්න.

- සොඳුරු උදෑසනක්
- වැස්සක අසිරිය
- සැන්දෑවේ මුහුදු වෙරළ
- ඉඬෝරයයි වැවයි
- අභිමානවත් සිංහ කොඩිය
- හේන අපේ සම්පතයි
- දළදා පෙරහැර
- මවු ගුණ සුවඳ
- සුන්දර සත්තුවත්ත
- සොඳුරු වන පෙදෙස

## ක්‍රියාකාරකම 04

පුවත්පත්වල පළවන ඔබ කැමති පද්‍ය පන්ති කියවන්න. එම පද්‍ය පන්ති එකතු කර පොත් පිංචක් පිළියෙල කරන්න.

## ක්‍රියාකාරකම 05

පහත සඳහන් කවිවල ඇතුළත් උපමා හා රූපක වෙන් කොට ලියා දක්වන්න.

1. සව් සිප් මහ සයුර
දුටු නැණ නැවින් පරතෙර
යුතු වූ කෙසර සර
කුස කුමර යන නමින් පුවතර

2. රතදරිනි නා ලිය
ගමනින් සදිසි නා ලිය
එපුර සරනා ලිය
කවුරු නම් හැකි වෙති වනාලිය

3. මොහු නෙත නිලුපුලේ
වුවනත සුපුන් සසලේ
හළුකළ රුපු කැලේ
කෙලෙස ඇතිවිද තෙදග විපුලේ

| | | | | |
|---|---|---|---|---|
| 4. | පුල් මල් කෙසරු මෙන් | - | රන්වනි තෙලෙ සරණ | යුග |
| | සපුමල් කැලෙව් තුඩ | - | මඳ රතිනි | මනහර |
| | නිලුපුල් දෙලෙව් සම්වනි | - | පිය පිය | පතර |
| | මලින් කළ රූ එව් | - | එබැවින් නුබින් එන | වර |